ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද්

# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

## කතෝලික ධර්මය

2025-05-09

පළමු වාර පරීක්ෂණය-2025 | 6 ශ්‍රේණිය | කාලය පැය 2

Learning Resource Center
R
De Mazenod College
Kandana

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ ඇති පොත් ගණන,
   i. 43 iii. 46
   ii. 27 iv. 73

2. නව ගිවිසුමේ ඇති පොතක් නොවන්නේ,
   i. රෝම iii. ගලාති
   ii. ඒපිස iv. ගීතාවලිය

3. රාජාලියෙකුගෙන් සංකේතවත් කරන ශුභාරංචිය වන්නේ,
   i. මාක් iii. ලූක්
   ii. ජොහාන් iv. මතෙව්

4. දෙවියන් වහන්සේ තුන්වන දිනයෙහි මවන ලද්දේ,
   i. අහස හා ජලය iii. ගොඩබිම හා ගස්වැල්
   ii. දවාල හා රාත්‍රිය iv. ඉර, හඳ හා තාරකා

5. පංච පුස්තකයට අයත් පොතක් වන්නේ,
   i. ගණන් කතාව iii. ශු.ලූක්
   ii. විරාවලිය iv. මලාකි

6. ශුභාරංචි ලියූ කතුවරුන් අතරින් අන්‍ය ජාතිකයෙකු වන්නේ,
   i. ශු. මතෙව් iii. ශු.මාක්
   ii. ශු. ජොහාන් iv. ශු. ලූක්

7. නෝවා හා ජල ගැල්ම පිළිබඳ කරුණු අඩංගු පොත වන්නේ,
   i. උත්පත්ති පොත iii. ධර් මදේශකයා
   ii. නික්මයාම iv. එළිදරව්ව

8. දී ඇති කරුණු අතරින් මැව්ල්ල ආරක්ෂා කර ගැනීමට හේතු වන කරුණක් වන්නේ,
   i. වනාන්තර විනාශ කිරීම
   ii. පොලිතින් භාවිතය
   iii. ජලය දූෂණය කිරීම
   iv. කැලි කසල ක්‍රමවත්ව බැහැර කිරීම

9. ශුභාරංචි කතුවරුන් අතරින් ශු. පේදුරු තුමාගේ ගෝලයෙක් වන්නේ,
   i. ශු. මතෙව් iii. ශු. මාක්
   ii. ශු. ලූක් iv. ශු. ජොහාන්

10. ස්නාවක ජොහාන් තුමාගේ ගාම්භීර දේශයෙන් ආරම්භ වී ඇති සුවිශේෂය වන්නේ,
    i. ශු. මතෙව් iii. ශු. මාක්
    ii. ශු. ලූක් iv. ශු. ජොහාන්

(ල.20)

02) නිවැරදි පිළිතුරු තෝරා හිස්තැන් පුරවන්න.
( අගෝස්තුස්, විවිධත්වය, තම ස්වරූපය, පංච පුස්තකය, සිංහයා )

i. දෙවියන් වහන්සේ ................................ අනුව මිනිසා මැවූ සේක.
ii. මාක් ශුභාරංචියේ සංකේතය වන්නේ............................................
iii. ශුද්ධ බයිබලයේ පළමු පොත් පහ ........................... ලෙස හැඳින්වේ.
iv. රෝම අධිරාජ්‍ය යේ සියලු වැසියන් සංගණනයක් ගැනීමට නියෝජ්‍යයක් නිකුත් කළ අධිරාජයා ......................... වේ.
v. මිනිස් සංහතිය තුළ ඇති ............................. මගින් දේව මැවිල්ලේ අගය වැඩිවේ. ල.10

03) පහත සඳහන් වැකි හරිනම් ( ✓ ) ලකුණද වැරදි නම ( X ) ලකුණද යොදන්න.

i. දෙවියන් වහන්සේ මිනිසා මැවූ දිනය ඉතා මනහර බව ප්‍රකාශ කළ සේක ( )
ii. මරියාවනි බිය නොවන්න, ඔබ දෙවියන් වහන්සේගේ වරප්‍රසාද ලද්දෙහිය යැයි ප්‍රකාශ කළේ ශු. ජුසේතුමාය ( )
iii. ලෝකය මවා දුන් දෙව් පියාණන්ට තුති ප්‍රශංසා කිරීම අපගේ යුතුකමක් නොවේ ( )
iv. ශු. ලූක්තුමා කැඳවීමට පෙර අයබදු එකතු කළ අයකැමියෙකි ( )
v. ඒදන් උයන වගාකර එය රැකබලා ගැනීම දෙව් පියාණන් ආදම්ට පැවරූ වගකීමක් වේඅ ( )

ල.10

## II කොටස

ප්‍රශ්න 05කට පමණක් පිළිතරු සපයන්න.

1)

i. ශුද්ධ බයිබලයේ ප්‍රධාන කොටස් 2ක ලියන්න. ල.2
ii. නව ගිවිසුමේ ශුභාරංචි හතර නම් කරන්න. ල.4
iii. නික්මයාම පොතෙහි අඩංගු කරුණු 3ක් ලියන්න. ල.6

2)

i. හෙබ්‍රෙව් බසින් පංච පුස්තකය හැඳින්වෙන නම කුමක්ද ? ල.2
ii. පංච පුස්තකය හැඳින්වෙන වෙනත් නම් 4ක් ලියන්න. ල.4
iii. පහත දී ඇති ශුභාරංචි කතුවරුන්ගෙන් එක් අයෙකු පිළිබඳ කෙටි සටහනක් ලියන්න. ල.6
- ශු. මතෙව්
- ශු. ලූක්

3)

i. දෙවියන් වහන්සේ මිනිසා මැව්වේ කීවෙනි දවසේද ? ල.2
ii. දෙවිපියා මිනිසාට පැවරූ වගකීම් 4ක් ලියන්න. ල.4
iii. දේව මැවිල්ල සුරැකීමට ඔබට කළ හැකි දේවල් 3ක් ලියන්න. ල.6

4)

i. දෙවියන් වහන්සේ සතරවන දින හා පස්වන දින මවන ලද්දේ මොනවාද ? ල.2
ii. මිනිසා අතින් දේව මැවිල්ල විනාශ වන අවස්ථා 3ක් ලියන්න. ල.6
iii. මිනිසාට සුදුසු අලංකාර පරිසරයක් ලබාදුන් දෙවිපියාට ස්තුති කිරීමට යාච්ඤාවක් ලියන්න. ල.4

5)

i. ජේසු කුමරු දොළොස්වියේදී ජෙරුසලමට ගියේ කුමන මංගල්‍යයක් සැමරීමටද ? ල.2
ii. හිස්තැනට සුදුසු වචන යොදන්න. ජේසුස් වහන්සේ a.......................................... හා කාය ශක්තියෙන්ද b.......................................................... මිනිසුන්ගෙන් පුසාදය ලබමින් වැඩුණු සේක. ල.4
iii. අන් අයට ආදර්ශයක් වීමට ඔබ තුල වර්ධනය කරගත යුතු ගුණාංග 3ක් ලියන්න. ල.6

6)

i. ශාස්ත්‍රවන්තයින් ජේසු බිළිඳුට ගෙනා තුටු පඩුරු 2ක් ලියන්න. ල.2
ii. ජුදා ජාතිකයන්ගේ ආගමික හා ජාතික චාරිත්‍ර 2ක් ලියන්න. ල.4
iii. ඔබ අන්‍යය හා සුහදතාව හා සහජීවනය ඇති කිරීමට කළ හැකි දේවල් 3ක් ලියන්න. ල.6